සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**

* **II** කොටසේ ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතුය.
* **III** කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට පමණක්** පිළිතුරු සැපයිය යුතුය.

## II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දොරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරන ලද 1: 50 000 පරිමාණයේ භූලක්ෂණ සිතියම පදනම් කරගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. සිතියම් ප්‍රදේශය තුළ දක්නට ලැබෙන ජලවහන රටා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අංක 01 චතුරස්‍රය තුළ ඇති ප්‍රධාන පරිපාලන මායිම නම් කරන්න. (ලකුණු 01)

iii. අංක 01 චතුරශ්‍රය තුළ හඳුනාගත හැකි ස්වාභාවික වෘක්ෂලතා වර්ගයක් සහ කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 02)

iv. සිතියම් ප්‍රදේශය තුළ දැක්වෙන ප්‍රධාන ජනාවාස රටාව නම් කරන්න. (ලකුණු 01)

v. සිතියමේ අංක 02 චතුරස්‍රය තුළ ඇති පොදුසේවා සපයන ආයතන 4ක් නම් කරන්න. (ලකුණු 02)

vi. අංක 02 චතුරස්‍රය 1: 12 500 පරිමාණයට ඇඳ එහි වී වගාව ඇඳ දක්වන්න. (ලකුණු 04)

vii. A3 මාර්ගය දිග කිලෝමීටර්වලින් ගණනය කරන්න. (ලකුණු 02)

viii. සිතියම් ප්‍රදේශය තුළ ඇති මාර්ගජාලය ව්‍යාප්තිය කෙරෙහි භූ විෂමතාව බලපා ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 03)

ix. සිතියම් ප්‍රදේශයේ වී වගා ව්‍යාප්තිය හා භූ විෂමතාව අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

2. සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් පහත සඳහන් දැ සපයා ඇති ලෝක ආකෘති සිතියමේ නිවැරදි ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| i | ග්‍රිනිච් රේඛාව | ii | හෝමූස් සමුද්‍ර සන්ධිය |
| iii | වියට්නාමය | iv | රොකි කඳුවැටිය |
| v | කාපන්ටේරියා බොක්ක | vi | ටිටිකාකා විල |
| vii | යෙනිසි ගංගාව | viii | ලැබ්‍රදෝර් ප්‍රවාහය |

ix 2026 ලෝක පරිසර දිනය පැවැත්වූ නගරය

x ඇමරිකා ඒක්සත් ජනපදය හා ඉරානය අතර සාම සාකච්ඡා පැවැත්වූ නගරය

(ලකුණු 10 x 1 = 10)

**III කොටස**

3. i. දත්ත හා තොරතුරු අතර වෙනස කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

ii. සංගහනය හා නියැදිය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

iii. ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ක්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iv. ප්‍රාථමික දත්ත රැස්කිරීමේදී මුහුණපාන ගැටළු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

4. i. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය නිර්වචනය කරන්න. (ලකුණු 02)

ii. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ මූලික උපාංග නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

iii. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ ප්‍රයෝජන දෙකක් එහි භාවිතය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ආශ්‍රිත දත්තවල නිරවද්‍යතාව කෙරහි බලපාන සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

5. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන ඝනත්වය

| දිස්ත්‍රික්කය | ජන ඝනත්වය | දිස්ත්‍රික්කය | ජන ඝනත්වය |
|---|---|---|---|
| කොළඹ | 3513 | කිලිනොච්චි | 100 |
| ගම්පහ | 1755 | මඩකලපුව | 207 |
| කළුතර | 793 | අම්පාර | 160 |
| මහනුවර | 739 | ත්‍රිකුණාමලය | 157 |
| මාතලේ | 251 | කුරුණෑගල | 359 |
| නුවරඑළිය | 434 | පුත්තලම | 274 |
| ගාල්ල | 675 | අනුරාධපුරය | 134 |
| මාතර | 659 | පොළොන්නරුව | 136 |
| හම්බන්තොට | 252 | බදුල්ල | 299 |
| යාපනය | 643 | මොනරාගල | 86 |
| මන්නාරම | 55 | රත්නපුරය | 348 |
| වවුනියාව | 96 | කෑගල්ල | 511 |
| මුලතිව් | 39 | | |

මූලාශ්‍රය - රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව

i. ඉහත වගුව යොදාගනිමින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන ඝනත්වය දැක්වෙන ජාලරේඛය හා සංඛ්‍යාත බහු අශ්‍රය නිර්මාණය කරන්න. (පන්ති ප්‍රාන්තර 05 යොදාගන්න) (ලකුණු 10)

ii. ඔබ විසින් නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවල ජන ඝනත්වය පිළිබඳ කරුණු තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. ඔබ විසින් නිර්මාණය කරන ලද ජාල රේඛයේ මාත පන්තිය සේයා කර දක්වන්න. (ලකුණු 02)

6. i. පහත වගුවේ ඇති දත්ත සැසඳුම් තීරු ප්‍රස්තාරය මගින් නිරූපණය කරන්න. (ලකුණු 08)

මෝටර් රථ ආනයනය (දහස්) 2013 - 2015

| වාහන වර්ගය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| ත්‍රිරෝද රථ | 85,586 | 83,233 | 132,865 |
| යතුරු පැදි | 159,791 | 322,257 | 349,441 |
| මෝටර් රථ | 27,084 | 44,030 | 108,866 |
| භාණ්ඩ ප්‍රවාහන රථ | 25,655 | 25,664 | 44,218 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ii. ඔබ විසින් නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් මොටර් රථ ආනයනයේ කාලීන වශයෙන් කැපී පෙනෙන ලක්ෂණ 04 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iii. ඉහත වගුවේ තොරතුරු පෙන්විය හැකි වෙනත් ප්‍රස්තාර ක්‍රමයක් නම් කර ඒහි නිර්මාණය උචිතබව යන තේමා යටතේ විස්තර කරන්න. (ලකුණු 03)